*සියළුම හිමිකම් ඇවිරිණි.*

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්**
**සිසුන් සඳහා උපකාරක සම්මන්ත්‍රණ මාලාව**
**පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

# ව්‍යවසායකත්ව අධ්‍යයනය I, II

## ව්‍යවසායකත්ව අධ්‍යයනය II

* **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. පහත දී ඇති සිද්ධිය හොඳින් කියවා (i) සිට (x)දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"විකසිත" 2016 වසරේ පැවැති අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ වාණිජ අංශයෙන් ඉහළින් ම සමත් වූ තරුණයෙකි. ඔහු විශ්ව විද්‍යාලයට ඇතුළත් නොවී ඔහුගේ නිර්මාණශීලි හැකියාව ප්‍රයෝජනයට ගෙන ව්‍යාපාරයක් කරගෙන යාමට අදහස් කරයි. පසුගිය කාලයේ පරිසර ප්‍රශ්න දෙස හොඳින් අධ්‍යයනය කර සිටි ඔහු, පානය කිරීමෙන් අනතුරුව තැන තැන විසිරී ඇති ඉවත ලන ප්ලාස්ටික් බෝතලය වෙනුවට වැඩි දියුණු කරන ලද නව වතුර බෝතලයක් වෙළෙඳපොලට ඉදිරිපත් කිරීමට සැලසුම් කරමින් සිටී.

ඔහුගේ සැලසුමට අනුව ඉතාම තුනීයට සකස් කළ කුඩා, මැටි වලින් තැනූ බෝතලයකට පානීය ජලය පිරවීමට හැකි පරිදි සකස් කර එම බෝතලය වටා කවුළු සහිත ප්ලාස්ටික් බෝතලයකින් ආවරණය කරනු ලැබේ. මේ නිසා බෝතලයේ ජලය මැටි කලයක මෙන් නැවුම් ජලය ලෙස රැඳෙන අතර භාවිතයෙන් අනතුරුව නැවත නැවතත් එම වතුර බෝතලය ප්‍රයෝජනයට ගැනීමට හැකියාව ඇත. මේ මගින් පරිසර හානිය ද අවම වන අතර නැවුම් ජලය පානය කිරීමේ අවස්ථාව පාරිභෝගිකයන්ට ලැබෙනු ඇති බව ඔහුගේ විශ්වාසයයි.

ඉහත අවස්ථාව ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම නවෝත්පාදනය සඳහා නමක් යෝජනා කරන්න.
(ii) මේ සඳහා සැලසුම් කිරීම අවශ්‍ය වන්නේද පැහැදිලි කරන්න.
(iii) ව්‍යාපාර සැලසුමක මූලිකාංග නම් කරන්න.
(iv) මෙම ව්‍යාපාරය ආරම්භ කිරීමට සහාය කර ගත යුතු ආයතන 02 ක් නම් කරන්න.
(v) අපේක්ෂිත නිෂ්පාදන ව්‍යාපාරය සඳහා තාක්ෂණික උපදෙස් ලබා ගත යුත්තේ කුමන ආයතනයෙන් ද?

විකසිත ආරම්භ කිරීමට යන ව්‍යාපාරයේ ඇස්තමේන්තු කරන ලද මුදල් ප්‍රවාහයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ඉඩම් සඳහා | රු. 1 000 000 |
| ගොඩනැගිලි | රු. 500 000 |
| උපකරණ සවි කිරීම | රු. 300 000 |
| ලියාපදිංචි ගාස්තු | රු. 25 000 |
| ව්‍යාපාර සැලැස්ම සඳහා | රු. 50 000 |
| අනෙකුත් වියදම් | රු. 75 000 |

<u>අපේක්ෂිත මාසික ආදායම්</u>

| | |
|---|---|
| වතුර බෝතල් අලෙවියෙන් | රු. 500 000 |
| හිස් භාජන ඇප තැන්පතු | රු. 50 000 |

ඉහත තොරතුරු ඇසුරෙන්

(vi) මුළු ජංගම නොවන වත්කම්වල වටිනාකම ගණනය කරන්න.
(vii) ආරම්භ කිරීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය ගණනය කරන්න.
(viii) ව්‍යාපාරය, එදිනෙදා ව්‍යාපාර කටයුතු කරගෙන යාමට අවශ්‍ය වියදම් හඳුන්වන නම සඳහන් කරන්න.
(ix) මුදල් ගලායාම් හතරක් දක්වන්න.
(x) මුදල් ගලා ඒම් දෙකක් දක්වන්න.

**(ලකුණු 2x10=20)**

02.

(i) ‘ව්‍යාපාරික අවදානම’ යන්න ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

(ii) ව්‍යාපාරිකයා හා ව්‍යවසායකයා අතර ඇති සමානකම් දෙකක් ලියන්න.

(iii) ව්‍යවසායකයාට හිමි වන ප්‍රතිලාභ හතරක් ලියන්න.

(iv) නව භාණ්ඩ හෝ සේවා උත්පාදනය කිරීමට ඇති හැකියාව නවෝත්පාදනයයි. නවෝත්පාදන සිදුවන ආකාර 2 ක් නම් කරන්න.

(v) නිර්මාණශීලීත්වය සාර්ථක ව්‍යවසායකයකු බිහිවීම සඳහා බලපාන සුවිශේෂී ගති ලක්ෂණයකි. නිර්මාණශීලීත්වයට බාධාකාරී වන සාධක දෙකක් ලියන්න.

(ලකුණු 2x5=10)

03. බොහෝ නවෝත්පාදන බිහි වී ඇත්තේ කුඩා පරිමාණ ව්‍යාපාර තුළිනි. ඔවුන්ට තම නිර්මාණශීලී චින්තනය අවදි කරමින් අලුත් නිෂ්පාදිත පිළිබඳව අත්හදා බැලීමට පහසු වේ.

(i) කුඩා පරිමාණ ව්‍යාපාරවල ගති ලක්ෂණ හතරක් ලියන්න.

(ii) කුඩා පරිමාණ ව්‍යාපාර කරගෙන යාමේදී බලපාන සීමාවන් දෙකක් ලියන්න.

(iii) කුඩා පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපාන හේතු හතරක් සඳහන් කරන්න.

(iv) ව්‍යවසායකයා අයිතිකරු ලෙස තම ව්‍යාපාරය තුළ ඉටු කරන කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

(v) ව්‍යවසායකයකුට තමා තුළ තාක්ෂණික කුසලතා වර්ධනය කර ගැනීමෙන් තම ආයතනය තුළ කළ හැකි කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 2x5=10)

04. “ව්‍යාපාර ආයතනයේ කටයුතුවලට බලපෑම් කරනු ලබන ව්‍යාපාරයට පිටතින් ඇති සියලුම සාධක බාහිර සාධක ලෙස හඳුන්වාදිය හැකිය.”

(i) ව්‍යාපාර බාහිර පරිසර සාධක 04 ක් සඳහන් කරන්න.

(ii) ව්‍යාපාර අභ්‍යන්තර පරිසරයට අයත් වන කළමනාකරුවන් ව්‍යාපාරයේ විවිධ කටයුතුවල නිරත වේ. එවැනි කටයුතු දෙකක් සඳහන් කරන්න.

(iii) වාර්ෂිකව පවත්වන දළදා පෙරහැර කුමන ව්‍යාපාර පරිසරයට අයත් වන්නේද යන්න සඳහන් කරන්න.

(iv) වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ පවතින ප්‍රධාන ව්‍යාපාර අංශ තුන සඳහන් කරන්න.

(v) ශ්‍රී ලංකාවේ වර්තමානයේ නව සන්නිවේදන තාක්ෂණය ඔස්සේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන මෙවලම කුමක්ද?

(ලකුණු 2x5=10)

05.

(i) අලෙවි සැලැස්මක අන්තර්ගතයන් 02 ක් නම් කරන්න.

(ii) වෙළෙඳපල විශ්ලේෂණයකට අවශ්‍ය තොරතුරු ලබාගත හැකි ක්‍රම 04 ක් නම් කරන්න.

(iii) පහත වගුවේ දැක්වෙන නිෂ්පාදිත සඳහා ආදේශකය බැගින් සඳහන් කරන්න.

| නිෂ්පාදිතය | ආදේශකය |
|---|---|
| 1. මී කිරි<br>2. තේ, කෝපි<br>3. බීම බෝතලය | ...............................................<br>...............................................<br>............................................... |

(iv) අලෙවිකරණ උපාය මාර්ග තේරීමේදී අලෙවි මිශ්‍රය ඉතා වැදගත් වේ. අලෙවි මිශ්‍රයේ ප්‍රධාන විචල්‍යයන් මොනවාද?

(v) ව්‍යාපාරයේ අලෙවි හා බෙදා හැරීමේ කාර්යයන්ට ඍජුව අදාළ වන ජංගම නොවන වත්කම් 2 ක් සඳහන් කරන්න.

(ලකුණු 2x5=10)

06. “සීමිත සම්පත් භාවිතා කොට පාරිභෝගික අවශ්‍යතා සහ වුවමනා ඉටු කරන ආයතනයන් ව්‍යාපාර සංවිධානයක් ලෙස හඳුන්වයි.”

(i) ව්‍යාපාර සංවිධානයක පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.

(ii) පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග 03 ක් නම් කරන්න.

(iii) හවුල් ව්‍යාපාරවල මූලික ලක්ෂණ 4 ක් සඳහන් කරන්න.

(iv) සංස්ථාපිත සමාගම් සරලව අර්ථ දක්වන්න.

(v) වරලත් ව්‍යාපාර හා සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව දෙකක් නම් කරන්න.

(ලකුණු 2x5=10)

07. පූර්ණිමාගේ ව්‍යාපාරයේ 2017.01.01 දිනට පැවති ශේෂයන් කිහිපයක් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| තොගය | රු.40 000 | ණයගැතියෝ | රු. 150 000 |
| ණය හිමියෝ | රු.12 000 | මුදල් ශේෂය | රු. 18 000 |

ජනවාරි මාසය තුළ සිදුවූ ගනුදෙනු

| | |
|---|---|
| විකුණුම් ආදායම | 356 000 |
| මාසය තුළ ගැනුම් | 120 000 |
| පරිපාලන වියදම් | 12 500 |
| විකුණුම් වියදම් | 180 000 |
| මූල්‍ය වියදම් | 8 000 |
| වෙනත් වියදම් | 2 000 |

ජනවාරි 31 දින රු. 23 000 තොග ඉතිරිව තිබුණි.

1) 2017.01.31 දිනට ඉතිරි මුදල් ශේෂය ගණනය කරන්න

(ලකුණු 04)

2) 2017.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පූර්ණිමාගේ ප්‍රතිඵල ගණනය කිරීමේ ලේඛනය සකස් කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 10)